සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# භූගෝල විද්‍යාව - I

**12 ශ්‍රේණිය**

**කාලය පැය 02 යි.**

උපදෙස් :

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් සමන්විත වේ.
- I කොටසට ඇතුළත් බහුවරණ ප්‍රශ්න 30 සඳහා මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
- II කොටස හා I කොටස පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.

## I කොටස

(01) මානුෂ භූගෝල විද්‍යාව යනු,

(1) මිනිසා හා පරිසරය අතර ඇති සම්බන්ධතාව හදාරන්නකි.

(2) මානුෂීය රටා හඳුනාගැනීමකි.

(3) මිනිස් ක්‍රියාකාරකම් අධ්‍යයනයකි.

(4) පරිසරයෙන් මිනිසාට වන බලපෑම අධ්‍යයනය කිරීමයි.

(5) මිනිසාගෙන් පරිසරයට වන බලපෑම අධ්‍යයනය කිරීමයි. (......)

(02) වර්තමාන ලෝක ජන සංඛ්‍යාව,

(1) මිලියන 7.5 කි. (2) බිලියන 7.5 ඉක්මවා ඇත. (3) බිලියන 13 ඉක්මවා ඇත.

(4) මිලියන 7.5 ඉක්මවා ඇත. (5) ට්‍රිලියනයකි. (......)

(03) මානව කටයුතු සෘජුවම පරිසරයේ පාලනයට යටත් වන බව පැවසෙන්නේ,

(1) පරිසර සත්‍යවාදය මඟිනි. (2) පරිසර නියතවාදය මඟිනි.

(3) පරිසර තුලනය මඟිනි. (4) පාරිසරික දැරීමේ ධාරිතාවය මඟිනි.

(5) යටත් විජිත වාදය මඟිනි. (......)

(04) කිසියම් ප්‍රදේශයක කිසියම් කාල පරිච්ඡේදයක ඒකරාශී වී ඇති ජන සමූහය හඳුන්වන්නේ,

(1) ජන සංඛ්‍යාව (2) ඒකකය (3) සමූහය (4) පිරිස (5) මනුෂ්‍යයන් (......)

(05) ජන සංඛ්‍යාවේ ගති ලක්ෂණයක් නොවන්නේ,

(1) විශාලත්වය (2) වර්ධනය (3) ව්‍යාප්තිය (4) ඝනත්වය (5) සඵලතාවය (......)

(06) වර්තමානය වන විට ජන සංඛ්‍යාව වැඩියෙන්ම පවතින රට වන්නේ,

(1) ඉන්දියාව (2) නයිජීරියාව (3) චීනය (4) රුසියාව (5) ජපානය (......)

(07) භෞතික සාධකයක් නොවන්නේ මින් කවරක් ද?

(1) භූ විෂමතාවය (2) ආර්ථික රටා (3) දේශගුණය (4) ජලවහනය (5) සාරවත් පස (......)

(08) ලොව ප්‍රධාන ජන සංකේන්ද්‍රන කලාපයක් වන්නේ,

(1) දකුණු ඇමරිකානු කලාපය (2) වයඹ දිග යුරෝපය (3) ඇන්ටාටිකානු ප්‍රදේශය

(4) අත්ලන්තික් දූපත් (5) කැනඩාව (......)

(09) ද්විතීයික ජන සංකේන්ද්‍රන වලට ඇතුළත් නොවන්නේ,

(1) නයිල් ගංගා මෝය ප්‍රදේශය (2) බටහිර අප්‍රිකාවේ සියෙරා ලියෝන්
(3) ලයිබීරියාව (4) අයිවරි කොස්ට්
(5) ඊසාන දිග ඇමරිකාව (......)

(10) ලෝක ජනගහන වර්ධනය හා ස්වභාවික සම්පත් අතර ඇති සම්බන්ධතාවය හඳුනාගත හැක්කේ කෙසේ ද?

(1) අනුලෝම සම්බන්ධතාවය
(2) ප්‍රතිලෝම සම්බන්ධතාවය
(3) වැඩිවන ජනගහනයට සාපේක්ෂව සම්පත් වැඩි නොවේ.
(4) වැඩිවන ජනගහනයට සරිලන සම්පත් වැඩි වේ.
(5) ජනගහනය හා ස්වභාවික සම්පත් ස්ථායී ව පවතී. (......)

(11) පද්ධති බෙදිය හැකි ප්‍රධාන වර්ග තුන වන්නේ,

(1) හුදකලා පද්ධති, ආවෘත පද්ධති, සංවෘත පද්ධති
(2) විවෘත පද්ධති, ආවෘත පද්ධති, හුදකලා පද්ධති
(3) හුවමාරු පද්ධති, ඒකාකාර පද්ධති, හුදකලා පද්ධති
(4) ද්විතීයික පද්ධති, ප්‍රාථමික පද්ධති, තෘතීක පද්ධති
(5) පාරිසරික පද්ධති, මානව පද්ධති, ජෛවීය පද්ධති (......)

(12) භෞම පද්ධතියෙහි උප පද්ධති 4 ට අයත් නොවන්නේ,

(1) වායු ගෝලය (2) පාංශු පැතිකඩ (3) ජල ගෝලය (4) ජෛව ගෝලය (5) ශිලා ගෝලය (......)

(13) පෘථිවිය වෙන්කළ හැකි ප්‍රධාන පද්ධති වර්ග 02 කුමක් ද?

(1) භෞතික පද්ධතිය හා ජෛව පද්ධතිය
(2) ශාක හා සත්ව පද්ධතිය
(3) මානව පද්ධතිය හා ශාක පද්ධතිය
(4) මාර්ග පද්ධතිය හා ජනාවාස පද්ධතිය
(5) රසායනික පද්ධතිය හා භෞතික පද්ධතිය (......)

(14) වායුගෝලයෙහි වැඩිපුරම අන්තර්ගත වී ඇති වායුව වන්නේ,

(1) ඔක්සිජන් (2) ආගන් (3) නයිට්‍රජන්
(4) කාබන්ඩයොක්සයිඩ් (5) ඕසෝන් (......)

(15) පාරිසරික පතනශීඝ්‍රතාවය පවතින්නේ වායු ගෝලීය ව්‍යුහයේ කුමන කොටසෙහි ද?

(1) පරිවර්තී ගෝලය (2) අපරිවර්තී ගෝලය (3) මෙසෝ ගෝලය
(4) තාප ගෝලය (5) අජඨ ගෝලය (......)

(16) ජල ගෝලයෙහි ව්‍යාප්තියෙහි මුළු පරිමාවෙන් වැඩිපුර පවතින්නේ කුමක් ද?

(1) මිරිදිය ජලය (2) මතුපිට ජලය (3) භූගත ජලය (4) කරදිය ජලය (5) පාංශු ජලය (......)

(17) සියල් හා සීමා කොටස් 02 හි එකතුව හඳුන්වන්නේ,

(1) කබොල (2) ප්‍රාවරණය (3) හරය (4) අසන්තතිය (5) පෘථිවිය (......)

(18) මොහෝරවිචික් අසන්තතිය පිහිටන්නේ කුමන ස්ථානයේ ද?

(1) සියල් හා සීමා ස්තර අතර (2) කබොල හා ප්‍රාවරණය අතර
(3) ප්‍රාවරණය හා හරය අතර (4) බාහිර හරය හා අභ්‍යන්තර හරය අතර
(5) ඉහත කිසිවක නොවේ (......)

(19) ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය මගින් කරනු ලබන්නේ,

(1) කාබෝහයිඩ්‍රේට් නිර්මාණය කිරීම.
(2) ආහාර ගබඩා කර තබා ගැනීම.
(3) ශක්තිය නිර්මාණය කිරීම.
(4) ආහාර නිෂ්පාදනය කිරීම.
(5) සූර්යාලෝකය පරාවර්තනය කිරීම. (......)

(20) ජෛව ගෝලයේ ක්‍රියාකාරීත්වය කෙරෙහි බලපාන සංරචකයක් වන්නේ කුමක් ද?

(1) ජලය (2) ජෛවීය සංරචක (3) ආර්ථික සංරචක
(4) ප්‍රජා විද්‍යාත්මක සංරචක (5) වායුව (......)

(21) භෞතික තොරතුරු දක්වන සිතියමක් නොවන්නේ,

(1) ජලවහන සිතියම් (2) දේශගුණ සිතියම් (3) පාෂාණ සිතියම්
(4) ස්වභාවික වෘක්ෂලතා සිතියම් (5) භෝග වගාව සිතියම් (......)

(22) මෙට්‍රික් සිතියමක 1cm කින් දැක්වෙන ගණන වන්නේ,

(1) 1km (2) 100 000km (3) 1/2 km (4) 3/4 km (5) 0.25km (......)

(23) ශ්‍රී ලංකාව ආවරණය වන පරිදි නිර්මාණය කර ඇති මෙට්‍රික් සිතියම් ප්‍රමාණය කීයද?

(1) 72 (2) 102 (3) 98 (4) 92 (5) 95 (......)

(24) සිතියමක පවතින පර්යන්ත තොරතුරු ගණන කීයද?

(1) 6 (2) 12 (3) 8 (4) 2 (5) 16 (......)

(25) මෙට්‍රික් සිතියමක 0.5cm කින් භූමියේ පෙන්නුම් කරන ගණන කීයද?

(1) 1km (2) 1/2 km (3) 0.25km (4) 0.05km (5) 0.2km (......)

(26) 22, 43, 19, 08, 20 හි පරාසය වන්නේ කුමන අගය ද?

(1) 2 (2) 42 (3) 35 (4) 20 (5) 19 (......)

(27) කේන්ද්‍රික ප්‍රවණතා මිනුමක් නොවන්නේ කුමක් ද?

(1) මාතය (2) විචලතාය (3) මධ්‍යස්ථය (4) මධ්‍යන්‍යය (5) මැද අගය (......)

(28) චාතුර්තික අපගමනය යනු කුමක් ද?

(1) අන්තර් චාතුර්තික පරාසයට ය. (2) අර්ධ අන්තර් චාතුර්තික පරාසයට ය.
(3) ඉහළ චාතුර්තිකයට ය. (4) චාතුර්තික සියල්ලෙහි එකතුවට ය.
(5) ඉහත කිසිවක් නොවේ. (......)

(29) වැඩිම වාර ගණනක් යෙදී ඇති පදය හඳුන්වන්නේ,

(1) මධ්‍යන්‍යය (2) වාර නියමය (3) මධ්‍යස්ථය (4) මාතය (5) අපගමනය (......)

(30) මිනුම් මගින් ලබා ගන්නා දත්ත අයත් වන්නේ,

(1) සන්තතික දත්ත (2) අසන්තතික දත්ත (3) ප්‍රාථමික දත්ත
(4) ද්විතීයික දත්ත (5) සාමූහික දත්ත (......)

(ලකුණු 2 × 30 = 60)

e-thaksalawa The National e-Learning Portal for The General Education

## II කොටස

- පළමුවන ප්‍රශ්නයටත්, දෙක හෝ තුන ප්‍රශ්නවලින් එකක් තෝරාගෙන ප්‍රශ්න දෙකකටත් පමණක් පිළිතුරු සපයන්න.

(01) ශ්‍රී ලංකාවේ 1 : 50,000 සිතියමකින් උපුටා ගන්නා ලද කොටසක් මෙහි දක්වේ. ඒ ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




SCALE 1:50 000

(01) (1) සිතියමේ මුහුදු ප්‍රදේශයේ දැක්වෙන රේඛා හඳුන්වන නම කුමක් ද? (ල.02)

(2) A, B, C, D කොටු කර ඇති ප්‍රදේශ වලින් නිරූපිත ලක්ෂණ පහත දක්වා ඇත. ඒවා නිසි ලෙස නම් කරන්න. (ල.02)

(i) ගංගා දූපත්

(ii) රළි බිම

(iii) ඉදිකළ ප්‍රදේශය

(iv) වගුරු බිම

(3) පහත ප්‍රකාශ නිවැරදි නම් '✓' ලකුණ ද, වැරදි නම් '×' ලකුණ ද ප්‍රකාශය ඉදිරියේ සටහන් කරන්න.

(i) මෙම සිතියමෙන් නිරූපණය වන්නේ ශ්‍රී ලංකාවේ දකුණු වෙරළබඩ ප්‍රදේශයකි. (.......)

(ii) සිතියම්ගත ප්‍රදේශය දකුණු දෙසට බෑවුම් වේ. (.......)

(iii) ප්‍රදේශයේ වැඩිම මාර්ග ඝනත්වයක් දක්නට ඇත්තේ උතුරු කොටසේ ය. (.......)

(iv) මාතර නගරයට බටහිරින් පිහිටි බටහිර පඹුරන (Pamburana West) ප්‍රදේශයේ ප්‍රධාන මාර්ගය දෙපස රේඛීය ජනාවාස දක්නට ලැබේ. (.......)

(v) (3) අංකයෙන් දැක්වෙනුයේ ගං මෝය ප්‍රදේශයකි. (.......)

(vi) මෙහි ඇති ගංගාව අරීය ජලවහන රටාවක් පෙන්නුම් කරයි. (.......)

(ල.06)

(4) සිතියම් ගත ප්‍රදේශයේ වෙරළ ආශ්‍රිත ව වැඩි ජන සංඛ්‍යාවක් දක්නට ලැබෙන්නේ කුමන ප්‍රදේශයේ ද? ඊට බලපා ඇති හේතු කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

(5) මෙම ප්‍රදේශයේ වෙරළ ආශ්‍රිතව පවතින භූ රූප නම් කරන්න. (ල.03)

(6) G, H කොටස් වල ඇති සංකේත වලින් නිරූපිත සංස්කෘතික ලක්ෂණ නම් කරන්න. (ල.02)

(02) (1) දුරස්ථ සන්නිවේදන ක්‍රම මොනවා ද? (ල.03)

(2) දෛශික සිතියම් යනු කුමක් ද? ඒ සඳහා උදාහරණ ලබා දෙන්න. (ල.04)

(3) චන්ද්‍රිකා ප්‍රතිබිම්බ යනු කුමක් ද? (ල.03)

(4) ප්‍රායෝගික භූගෝල විද්‍යාවේ දියුණුවට නව සිතියම් විද්‍යාත්මක ශිල්ප ක්‍රම මගින් ලැබෙන දායකත්වය පැහැදිලි කරන්න. (ල.05)

(5) භූගෝලීය තොරතුරු පද්ධති භාවිතයෙන් සිතියමක් නිර්මාණය කිරීමට අවශ්‍ය දත්ත සපයා දෙන ප්‍රධාන මූලාශ්‍ර මොනවා ද? (ල.02)

(6) භූගෝල විද්‍යා තොරතුරු පද්ධතියේ තාක්ෂණ ශිල්පීය ක්‍රම සිතියම් නිර්මාණයට යොදා ගැනීමේ වාසි 03 ක් සඳහන් කරන්න. (ල.03)

(03) ලොව සාගර වල වර්ගඵල වර්ග කිලෝමීටර මිලියන වලින් පහත දැක්වේ.

| සාගරය | අත්ලන්තික් | ඉන්දියන් | ඇන්ටාටික් | ආක්ටික් | පැසිෆික් |
|---|---|---|---|---|---|
| මිලියන ($km^2$) | 110 | 75 | 20 | 10 | 200 |

(1) සුදුසු ප්‍රස්තාරයකින් උක්ත තොරතුරු නිරූපණය කරන්න. (ල.10)

(2) දත්ත හා තොරතුරු යන්න වෙන වෙනම උදාහරණ සහිතව හඳුන්වන්න. (ල.04)

(3) දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම 03 ක් ලියන්න. (ල.03)

(4) කේන්ද්‍රීය ප්‍රවණතා මිනුම් නම් කරන්න. (ල.03)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# භූගෝල විද්‍යාව - II

**12 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

- එක් එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරා ගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

## I කොටස  භෞතික භූගෝල විද්‍යාව

(01) (1) පද්ධතියක් යනු කුමක් ද? (ල.03)

(2) පද්ධති වර්ග තුන හඳුන්වන්න. ඒ සඳහා උදාහරණ ලබා දෙන්න. (ල.06)

(3) භෞම පද්ධතිය යනු කුමක් ද? (ල.03)

(4) වායු ගෝලයෙහි ස්තරායනය ඇඳ දක්වන්න. (ල.04)

(5) පරිවර්තී ගෝලය හඳුන්වන්න. (ල.04)

(02) (1) ජල ගෝලීය පද්ධතියේ ව්‍යාප්තිය දක්වන්න. (ල.05)

(2) ජල මූලාශ්‍ර දූෂණය වන ක්‍රම පිළිබඳ පැහැදිලි කිරීමක් සිදු කරන්න. (ල.05)

(3) ජල හිඟය හා ජල දූෂණය නිසා මිනිසාට ඇති වන බලපෑම් උදාහරණ සහිතව විමසන්න. (ල.05)

(4) ජල චක්‍රය රූප සටහනකින් ඇඳ දක්වන්න. (ල.05)

(03) (1) ශිලා ගෝලයෙහි හරස්කඩක් ඇඳ නම් කරන්න. (ල.05)

(2) ප්‍රධාන තැටි 06 නම් කරන්න. (ල.05)

(3) මුළුමනින්ම සාගරික තැටියක් ලෙස හඳුන්වන්නේ කුමන තැටිය ද? (ල.05)

(4) මිනිසා විසින් පෘථිවි ව්‍යුහයට කරනු ලබන බලපෑම් පැහැදිලි කරන්න. (ල.05)

(5) භූමිය ආරක්ෂා කිරීමට මිනිසා විසින් ගත යුතු ක්‍රියාමාර්ග ඉදිරිපත් කරන්න. (ල.05)

(04) (1) පාෂාණ වර්ග 03 නම් කරන්න. (ල.03)

(2) උක්ත දක්වන ලද පාෂාණ පිළිබඳ හැඳින්වීමක් සිදු කරන්න. (ල.06)

(3) පාෂාණ චක්‍රය ඇඳ දක්වන්න. (ල.05)

(4) ශ්‍රී ලංකාවේ ප්‍රධාන පාෂාණ කලාප 03 නම් කරන්න. (ල.03)

(5) ඉන් එකක් පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න. (ල.03)

## II කොටස  මානුෂ භූගෝල විද්‍යාව

(01) (1) මානුෂ භූගෝල විද්‍යාව කුමක් දැයි හඳුන්වන්න. (ල.03)

(2) පරිසර නියතවාදය හා පරිසර සක්‍රියතාවාදය කෙටියෙන් හඳුන්වන්න. (ල.04)

(3) මානුෂ භූගෝල විද්‍යාවෙහි අවකාශීය ස්වභාවය පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ල.03)

(4) මිනිසා පරිසරය අභිබවා යෑමට බලපෑ හේතු සාධක පැහැදිලි කරන්න. (ල.05)

(5) පරිසරය මිනිසාට කරනු ලබන බලපෑම උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල.05)

(02) (1) ''ලෝක ජන සංඛ්‍යාවෙන් සංවර්ධිත රටවල ප්‍රමාණය අඩුවන අතර සංවර්ධනය වෙමින් පවතින රටවල සීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබේ.'' මෙම කියමන උදාහරණ සපයමින් පැහැදිලි කරන්න. (ල.08)

(2) ආදිතම යුගයේ සිට වර්තමානය තෙක් ජන සංඛ්‍යාව වර්ධනයේ ස්වභාවය පිළිබඳ දක්වන්න. (ල.08)

(3) ලෝකයේ ප්‍රධාන ජන සංකේන්ද්‍රන කලාප 04 හඳුනාගෙන ලෝක සිතියමක ලකුණු කරන්න. (ල.04)

(03) (1) ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තියට බලපෑ හේතු විස්තර කර දක්වන්න. (ල.08)

(2) ජන සංඛ්‍යා පිරමීඩ පිළිබඳ හැඳින්වීමක් රූප සටහන් සහිතව ඉදිරිපත් කරන්න. (ල.08)

(3) ජන සංඛ්‍යාවේ සංයුතිය හඳුනාගත හැකි ආකාර 04 ක් දක්වන්න. (ල.04)

(04) (1) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ මෑත කාලීන ප්‍රවණතා පැහැදිලි කරන්න. (ල.08)

(2) කෙටි සටහන් ලියන්න. (ල.2×4=8)

(a) පුම්තිරි අනුපාතය

(b) දළ මරණ අනුපාතය

(c) දළ උපත් අනුපාතය

(d) ස්වභාවික වර්ධන අනුපාතය

(3) සංක්‍රමණ ආකාර 04 දක්වන්න. (ල.04)

The National e-Learning Portal for The General Education